# උත්ථාන සමයේ සතරවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි                                   ක්‍රියා 11:1-18

**"දෙවියන් වහන්සේ විජාතීන්ට ද ජීවනය සලසන මනස්ථාපනයක් දුන් සේක."**

විජාතීන් විසින් ද දේව වචනය පිළිගනු ලැබූ බව ජුදයෙහි සිටි අපෝස්තුළුවරයන්ටත් සහෝදරයන්ටත් ආරංචි විය. පේදුරු ජෙරුසලමට ආ කල චර්මඡේදිතයෝ ඔහුට දොස් පවරමින්, "ඔබ අචර්මඡේදිත මිනිසුන් වෙතට ගොස් ඔවුන් සමග කෑම කෑවේ මන්දැ" යි ඇසූහ. එවිට පේදුරු ඒ කාරණය මුල පටන් පිළිවෙලින් පහදා දෙන්නට පටන් ගෙන මෙසේ කීය. "මම ජොප්පා නුවර යාච්ඤා කරමින් සිටි විට අහසෙන් බස්වන ලද සතර කොනින් බැඳුනු මහත් රුවලක් වැනි දෙයක් පහත් වෙනවා දර්ශනයකින් දිටිමි. එය මා ළඟටම පැමිණියේය. මා එය සෝදිසියෙන් බැලූ විට පොළවේ සිව්පාවුන්ද, වන මෘගයන් ද උරග ජාතීන්ද ආකාශ පක්ෂීන් ද දිටිමි. එවිට 'පේදුරු නැගිට මරා කන්නැ'යි මට කියන ශබ්දයකුත් ඇසිනි. මම ද 'ස්වාමීනි, එය නම් කළ නොහැක. අපවිත්‍ර අකැප දෙයක් කිසි කලෙකත් මා කටට ගෙන නැතැ' යි කීවෙමි. එහෙත් දෙවන වරටත් අහසෙන් හඬක් මට කතා කරමින්, 'දෙවියන් වහන්සේ පවිත්‍ර කළ දේ, පිළිකුල් යයි නොකියන්නැ'යි කීය. තුන් වරක්ම මෙය සිදු විය. ඉන්පසු නැවත සියල්ල අහසට ඇද ගන්නා ලද්දේය.
එවේලෙහිම කායිසාරියෙන් මා වෙත එවන ලද මිනිස්සු තුන් දෙනෙක් මා විසූ නිවෙස ඉදිරියෙහි සිටියහ. ආත්මයාණන් වහන්සේ ද, සැකයක් නැතිව ඔවුන් සමග යන ලෙස මට අණ කළ සේක. මේ සහෝදරයන් සදෙනාත් මා සමග ගියහ. අපි කොර්නේලියස්ගේ ගෙදරට ඇතුළු වීමු. එවිට ඔහු තමාගේ ගෙයි දේව දූතයා සිටිනු දුටු හැටිත්, 'ජොප්පාවට මිනිසුන් යවා පේදුරු නම් ලත් සීමොන් කැඳවන්න. ඔහු වනාහි ඔබ සහ ඔබේ ගෙදර සියල්ලන්ගේ ද ගැලවීම සලසා දෙන දහම ඔබට දෙසන්නේ ය' යි තමාට කී හැටිත් අපට දැන්වීය. මා කතා කරන්නට පටන් ගත්

කල ශුද්ධාත්මයාණන් වහන්සේ මුලදී අප කෙරෙහි පහළ වූ සේම ඔවුන් කෙරෙහිත් පහළ වූ සේක.

'එකල, ජුවාම් බෞතීස්ම ස්නාපනය කළේ වතුරෙන් ය. ඔබ බෞතීස්ම ස්නාපනය ලබන්නේ ශුද්ධාත්මයෙන් ය' යි ස්වාමින් වහන්සේ වදාළ වචනය මට මතක් විය. එබැවින් ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහා ගත් කල්හි අපට දෙනු ලැබුවාක් මෙන් දෙවියන් වහන්සේ ඔවුන්ටත් එම දීමනාව ම දුන් සේක් නම් දෙවියන් වහන්සේට බාධා කිරීමට මම කවරෙක්දැ' යි කීය.
ඔව්හු ඒ අසා නිහඬ වූහ. 'එසේ නම් විජාතීන්ට දෙවියන් වහන්සේ ජීවනය සලසන මනස්ථාපනයක් දුන් සේකැ'යි කියමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 42 : 1-2. 43 : 3-4

පිළිතුර: ජීවමාන දෙවිඳුන් කෙරෙහි මාගේ සිත පිපාසා වන්නේය.

ගීය:

දෙවියනි, මුවා සිසිල් දිය දහරට ලොල් වන සේ ඔබ කෙරෙහි මට තද පිපාසයක් ඇත. දෙවිඳුන් කෙරෙහි ජීවමාන දෙවිඳුන් කෙරෙහි මාගේ සිත පිපාසා වන්නේය.

මම කවදා අවුත් දෙවිඳුන් ඉදිරියේ පෙනී සිටිම් ද?
ඔබේ ආලෝකය සහ සත්‍යය මට දුන මැනව. ඒවායින් මට මඟ පෙන්වීම ලැබී ඔබේ ශුද්ධ සියොන් පව්වට ආපසු ගොස් ඔබේ වාස භවනය වන දෙව් මැඳුරට පිවිසීමට මට ලැබේවා!

දෙවියනි, මාගේ දෙවියනි එවිට මම දිව්‍ය පූජාසනය වෙත මාගේ පස්වනක් ප්‍රීතිය වන දෙවිඳුන් වෙත ගොස් වීණා වාදනයෙන් ඔබ පසසන්නෙමි.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
“මම යහපත් බැටළු එඬේරා වෙමි.
මම මගේ බැටළුවන් අඳුනමි. ඔව්හු ද මා අඳුනති”යි
ස්වාමින් වහන්සේ වදාළ සේක.”
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 10: 1-10

**“බැටළුවන්ට දොරටුව නම් මම ය.”**

ජේසුස් වහන්සේ කතා කරමින් “ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. දොරටුවෙන් බැටළු ගාලට ඇතුළු නොවී අන් තැනකින් නැඟී පැන එන්නා සොරෙක් ද කොල්ලකන්නෙක් ද වේ. එහෙත් දොරටුවෙන් ඇතුළු වෙන්නා බැටළුවන්ගේ එඬේරා ය. දොරටු පාලයා ඔහුට දොර හරියි. බැටළුවෝ ඔහුගේ කටහඬ අඳුනති. ඔහු තමාගේම බැටළුවන්ට නම් කියා අඬ ගසා උන් පිටතට ආ විට උන්ට පෙරටුව යයි. බැටළුවෝ ද ඔහුගේ කටහඬ අඳුනන බැවින් ඔහු පසු පස්සේ යති. එහෙත් බැටළුවෝ අමුත්තකු පසු පස්සේ නොයති. එපමණක් නොව, ඔහු වෙතින් පලා යති. මන්ද, උන් අමුත්තන්ගේ කටහඬ නාඳුනන බැවිනි’ යි වදාළ සේක. ජේසුස් වහන්සේ මේ උපමාව ඔවුන්ට වදාළ නමුත්, එයින් කුමක් අදහස් කළ සේක් දැයි ඔවුන් තේරුම් නොගත්හ.
එහෙයින් යළිත් ජේසුස් වහන්සේ ඔවුන් අමතා “ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. බැටළුවන්ට දොරටුව මම ය. මට පළමුව ආ සියල්ලෝම සොරු ද කොල්ලකන්නෝ ද වෙති. බැටළුවෝ ඔවුන්ට ඇහුම්කන් නුදුන්හ. දොරටුව මම ය. මා තුළින් යමෙක්

ඇතුළු වන්නේ ද ඔහු ගලවනු ලැබ ඇතුළට හා පිටතට ගොස් ආහාර ලබන්නේය. සොරා එන්නේ සොරකම් කරන්නටත් මරන්නටත් විනාශ කරන්නටත් පමණකි. මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිසය. සපුරා ම එය ලැබෙන පිණිස ය" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.

(මෙම සතියේ ඉරුදින දී ඉහත සඳහන් සුවිශේෂ පාඨය භාවිතා කර ඇත්නම් පළමු වන වසරේදි පහත දැක්වෙන සුවිශේෂ පාඨය භාවිතා කළ හැකිය.)

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 10: 11-18

### "මම යහපත් එඬේරා වෙමි."

'මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේය. එඬේරෙකු නොවන එසේම බැටළුවන්ගේ අයිතිකාරයා ද නොවන කුලී කාරයා, වෘකයා එනු දැක බැටළුවන් හැර දමා පලා යන්නේය. වෘකයා ද උන් වෙත කඩා පැන විසුරුවා හරින්නේය. ඔහු පලා යන්නේ ඔහු කුලීකාරයෙකු වන නිසාත්, බැටළුවන් ගැන සැලකිල්ලක් ඔහුට නැති නිසාත් ය.'

'මම යහපත් බැටළු එඬේරා වෙමි. මම මාගේ බැටළුවන් අඳුනමි. පියාණන් වහන්සේ මා ද, මා පියාණන් වහන්සේ ද අඳුනන්නාක් මෙන්, මම මාගේ බැටළුවන් අඳුනමි. බැටළුවන් උදෙසා මාගේ දිවි පුදමි. තවද, මේ රැළට අයිති නොවූ අන් බැටළුවෝ ද මට ඇත්තාහ. මා ඔවුන් ද ගෙන ආ යුතුය. ඔව්හු මාගේ හඬට ඇහුම්කන් දෙති. මෙසේ එක රැළක් ද එක එඬේරෙක් ද වන්නාහ.'

'මා පියාණන් මට ප්‍රේම කරන්නේ, මා නැවත ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි. කිසිවෙක් එය මගෙන් පැහැර නොගනිති. මාගේ ම කැමැත්තෙන් එය පුදමි. එය පුදන්නට මට බලය තිබේ. එය යළි ලබන්නට ද මට බලය තිබේ. මේ නියමය මාගේ පියාණන් වහන්සේගෙන්ම ලදිමි' යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.